සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All rights reserved.

47	S	I,II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2026 - (අනුහුරු ප්‍රශ්න පත්‍රය)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Ord.Level) Examination, 2026

සිංහල සාහිත්‍ය රසාස්වාදය	I, II
இலக்கிய நயம் சிங்க	I, II
Appreciation of Sinhala Literary Texts	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්:

(i) **I** හා **II** පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.

(ii) **I** පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය.

(iii) **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

(iv) **I** පත්‍රය සඳහා ලකුණු **40**ක් ද **II** පත්‍රය සඳහා ලකුණු **60**ක් ද හිමි වේ.

සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය
(සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න).

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු**, දී ඇති හිස්තැන් මත ලියන්න.

(i) ‘දේවයන් වහන්ස පුත්‍ර වරයක් දුන මැනවැ’

(අ) මෙම ප්‍රකාශය කාගේ ද?

.....

(ආ) මෙහි ‘දේවයන් වහන්ස’ ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද?

.....

(ii)

මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ	ඇත
නිදොස් කෙනකු මෙදියත උපදනේ	නැත
වෙසෙස් සිනිදු මුවරද බර **සහස්**	**පත**
කොරොස් නළින් යුතු වෙයි කටු පෙළිනි	යුත

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

.....

.....

.....

Past Papers Wiki

(ආ) 'නිදොස් කෙනකු මෙදියත උපදනේ නැත' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

.....

.....

(iii) 'ඩිංගිරිගෙන් බත් ඉල්ලාගෙන කාලා නිදාගන්න'

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?

.....

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතියේ රචකයාගේ නම ලියන්න.

.....

(iv) 'පස්සා පයින් අඬෙන් ගසා දත් වගුරුවා පියමි'

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

.....

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය රචනා වූ සාහිත්‍ය අවධිය කුමක් ද?

.....

(v) 'මාමේ මාත් ටිකක් කපන්න ද?'

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කියන ලද්දක් ද?

.....

(ආ) මේ පාඨය ඇතුළත් කෘතිය නම් කරන්න.

.....

.

(ලකුණු 04 x 5 = 20යි)

2. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

“එ බස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තෝ සෝධා නොනිමි හිස කේ නො බැඳ වහා අවුත් ‘ගියත් සුළු ගෙයි, වහා එව’යි කිවු ය. උන් කියා ලු බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිනි තරව වැද ගන්නා සේ තරයේ ම වැද ගත. බුදුනුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් නන්ද කුමරුනි, මහණ වවුදැ'යි වදාළ සේක. බුදුන් වදාළ බස මඟුලෙන් හෙළා ලූ කප උගුළුවන්ට බැරියා සේ උගුළුවා ලන්ට බැරි හෙයින් ‘මහණ නො වෙමි’යි නොකියා ‘යහපත මහණ වෙමි’ කියා ගිවිස්සාහ. එබැවින් තුලුන් මහණ කරව’යි වහන්දැට භාර කොට කිඹුල්වත් නුවරට වැඩි තුන් වැනි දවස් නන්ද කුමරුන් මහණ කොට සත් වන දවස් බිම්බා බිසොවුන් විසි දහසක් රහතුන් පිරිවරා නුවරට සිහා වැඩි තමන් වහන්සේ පෑ ලා 'හෙම්බා පුත, තුලුන් දුටු ද තුලුන් සිහා ඇවිදිනා පමණක් මුත් ගවු දෙගවු සතරගවු පමණ මුවවිට පළල ඇති පොළොව බොළ විතර උස ඇති නිධාන සැළ සතරෙක් ඇත. මුන් මහණ වන්ට ගිය තැන් පටන් නො දකුම්හ. තොප සක්විති වන නියාව දෙතිස්මහ පිරිමිනී ලකුණු නැමැති නිමිත්ත දන්නා දෙතිස් දෙනකු කියා සිටුත් වස්තුත් වුවමනා වේ ද? තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව’යි රහල් කුමරුන් සරහා යවූ කල්හි කුමාරයෝත් දායාද ඉල්වමින් පසු පස්සෙහි ගමන් ගත්හ. බුදුහුත් නො නැවතූ සේක. කැටි ව යන්නෝත් බුදුන් හා කැටි ව යන ගමන නවතන්ට යුක්ති නැති වන්නා නො නැවතූහ. රහල් කුමරුහු ද සඳ හා කැටි ව නික්මුණු නකත් තරුවක් මෙන් නික්ම වෙහෙරට ගියහ.

බුදුහු ‘මේ තෙමේ සන්තක වස්තුවට තමා ආවේණික ව හිමි හෙයින් ඉල්වයි. ඒ සම්පත් තරමටත් ඒ මුල් වන ආදීනව මහත. මා සර්වඥතා ඥාන නමැති එක ධනය දී ලා ලත් ධන සතෙක් ඇත. මූටත් ඒ ධන සත ම දෙමි’යි සිතා වදාරා සැරියුත් මහතෙරුන් වහන්සේ කැඳවාලා ‘හෙම්බා ශාරිපුත්‍රයෙනි, තෙල රහල් කුමරු අප අතින් වස්තු ඉල්වති. මහණ වන්ට එන ගමනේ අප ලා ලා ආ රකවල් නැති හෙයින් මුන් ඉල්වන සම්පත් තුබුවා නැත. හැමත් ධනයෙක් ම වේ ද? අපට ඒ ඇති ව තුබූ ධන සත ම දෙන නියායෙන් තුලුන් මහණ කරව’යි විධාන කොට මහණ කැරවූ සේක.”

(i) මෙම පාඨයෙහි ඇතුළත් උපමා දෙකක් උපුටා දක්වන්න.

.....

.....

(ලකුණු 04යි)

(ii) මෙහි සඳහන් පරිදි රාහුල කුමරුන් බුදුන් වහන්සේ පසුපස පැමිණියේ කුමක් සඳහා ද?

.....

(ලකුණු 04යි)

(iii) “මඟුලෙන් හෙළා ලූ කප උගුළුවන්ට බැරියා සේ" යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

.....

(ලකුණු 06යි)

(iv) “සද්ධර්මරත්නාවලී කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇත.” ඉහත ඡේදයෙහි නිදසුනකින් පහදන්න.

.....

.....

.....

.....

.....

(ලකුණු 06යි)

නැතහොත්

මොකටද අම්මේ
අම්මට ගැහුවේ
මාමල දෙන්නෙකු
වට කරලා
ඇඟ පත තැළිලා
රිදෙනව ඇතිනේ
කොච්චර ගැහුවද
බැඳ දමලා
දෙපා සතාගේ
ළඟ කා බී ගෙන
සිටියම ගති ගුණ
වෙනස් වෙලා
මාමල ඔහොමයි
උන්ගේ බහටම
හැරනව නැකම
අත් හැරලා
අම්මල කන කොට
වතුර නාන කොට
තිප්පලෙ නිදියන
කොට වැටිලා
කැලේ මාමලා
ඉඩ දී අයිනට
වෙලා ඉන්නවා
නොවැ රැකලා
මිනිහයි කියනා
දෙපා සතාගේ
ළඟින් ගියත් ඇති
පොඩි පුතුනේ
ළෙහි පපු කම් නෑ
හරි ගති ගුණ නෑ
ඒ බව කවුරුත්
දන්නවනේ
බෝසත් මුත්තල
ඉස්සර හිටියලු
අපේ කුලෙත් හොඳ
නම දුන්නේ
දළ දන් දුන්නලු
බුදු බව ලැබුවලු
ඒ ගැනවත් නැහැ
සලකන්නේ
අම්මෙ අම්මෙ අර
දෙපා සතුන් හෙම
ඔය තොරතුරු නැතු-
-වද දන්නේ
බෝසත් මුත්තල -
ගේ නාමෙට වත්
කිරි උගුරක් නැහැ
නොවැ දෙන්නේ
මිනිසුන් අතරේ
සමගිය නැති වී
බුදු හාමුදුරුවො
එදා අනේ
පාරෙලෙයිය වන -
යට වැඩි දා අපෙ
මුත්ත කෙනෙකි
උපකාර වුණේ

(i) මෙම පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද?

.....

.....

(ලකුණු 04යි)

(ii) ඇත් පරපුරේ වටිනාකම හා උතුම්බව පෙන්වීමට කවියා යොදාගත් අවස්ථා දෙකක් උපුටා දක්වන්න.

.....

.....

(ලකුණු 04යි)

(iii)

"මිනිහයි කියනා

දෙපා සතාගේ

ළඟින් ගියත් ඇති

පොඩි පුතුනේ"

මෙම පද්‍ය ඛණ්ඩයෙන් ධ්වනිත වන අදහස කුමක් ද?

.....

.....

(ලකුණු 06යි)

(iv) මෙම පද්‍ය නිර්මාණයෙන් මිනිස් චර්යා සියුම් විවේචනයකට ලක් කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

.....

.....

.....

.....

.....

.....

(ලකුණු 06යි)

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All rights reserved.

47	S	I,II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2026 (අනුහුරු ප්‍රශ්න පත්‍රය)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Ord.Level) Examination, 2026

සිංහල සාහිත්‍ය රසාස්වාදය	I, II
இலக்கிய நயம் சிங்களம்	I, II
Appreciation of Sinhala Literary Texts	I, II

සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

දකුණේ මෙන් ම උතුරෙත් හිරු නඟියි — උදේ
රන් තරු රිදී තරු හවසට පෙළට — ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර — හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ — වැදේ

ගෙන එයි මිහිරි ගී මඳ නල හමන — විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු — මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව — පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු — ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය — ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු — නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය — මත
උගනිමි කිම ද මිනිසා සතු දෙ නෙත — තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර — වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම — සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි — හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැළෙන — ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ — කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි — පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන — විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස — මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයක දි එකට හමු වන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමු වේවා දකුණ

සැලකිල්ලට ගත යුතු කරුණු:

(අ) මෙම පද්‍ය පන්තියට පාදක වූ අත්දැකීම
(ආ) යොදාගත් ආකෘතිය
(ඇ) පද්‍ය පන්තියේ භාෂා භාවිතය
(ඈ) උතුරේ හා දකුණේ ජනයා අතරත්, පරිසරය අතරත් සමානකම්
(ඉ) මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු

(ලකුණු 06 × 5 = 30යි)

2. ‘තුංමං හන්දිය’ නවකතාවේ සාර්ථකත්වයට එහි යොදා ගත් බස් වහර හේතු විය. නිදසුන් තුනක් දක්වමින් පහදන්න.

(ලකුණු 15යි)

3. ‘පාඨක, ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කිරීමට සමත් කුස ජාතකය අපූර්වතම කතා වස්තුවකි. උදාහරණ තුනක් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15යි)

4. සමකාලීන සමාජය මනාව නිරූපණය කරන කෙටිකතාවක් ලෙස 'වැලපීම' කෙටිකතාව අගය කළ හැකි ය. නිදසුන් තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

5. සමාජයට උපදෙස් ලබා දීමේ දී අලගියවන්න මුකවෙටිතුමා සත්ත්ව චරිත හා ක්‍රියාකාරකම් යොදාගෙන ඇත. උදාහරණ තුනකින් පහදන්න.

(ලකුණු 15යි)

47- සිංහල සාහිත්‍ය රසාස්වාදය අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2026

ආදර්ශ පිළිතුරු සහ ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

1. (i) (අ) සීලවතී බිසව / ඔක්කාක රජතුමාගේ අග මෙහෙසිය

(ආ) ශක්‍ර දේවේන්ද්‍රයා / සක් දෙවිඳු

(ii) (අ) සහස්පත - නෙලුම් මල / නෙලුම / පියුම
කොරොස් නළින් - කොරසැඩි දණ්ඩකින් / කොරසැටි දණ්ඩකින් / ගොරහැඩි දණ්ඩකින් / රළු වූ දණ්ඩකින් / ගොරෝසු දණ්ඩකින්

(ආ) දොස් නැති පුද්ගලයෙකු මෙලොව උපදින්නේ නැත. (මේ අදහස මතුවන ආකාරයට ලියා ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.)

(iii) (අ) වෙසක් පහන කෙටිකතාවේ කථකයා / කථකයා / දෙවන පිරිමි ළමයා / මල්ලි

(ආ) ජී.බී.සේනානායක

(iv) (අ) නන්ද තෙරුන් වහන්සේගේ වස්තුව

(ආ) දඹදෙණි යුගය/ දඹදෙණි අවධිය

(v) (අ) කථකයා / රණතුංග ආරච්චිගේ සිරිසේන / ආර්.ඒ. සිරිසේන

(ආ) තුං මං හංදිය (ලකුණු 4× 5 = 20)

2. (i) "දිවුල් ලාටු මුසු වයිති තරව වැද ගන්නා සේ"
"මඟුලෙන් හෙළා ලූ කප උගුළුවන්ට බැරියා සේ"
"සඳ හා කැටි ව නික්මුණු නකත් තරුවක් මෙන්"

(ඉහත උපමාවලින් දෙකක් අවශ්‍ය ය.) (ලකුණු 4)

(ii) දායාද ඉල්ලා ගැනීමට / තමාට හිමි ධන නිධාන ඉල්ලා ගැනීමට ආදී ගැළපෙන උත්තරයකට ලකුණු පිරිනමන්න. (ලකුණු 4)

(iii) මංගල නැකතකින් සිටුවන ලද කණුව ගලවන්නට නොහැකි මෙන් / බැරි සේ (ලකුණු 6)

(iv) ගැළපෙන නිදසුනක් ඇසුරින් සද්ධර්මරත්නාවලි කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇති බව සඳහන් කරමින් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

<u>උදාහරණ:-</u>

- හිස සෝදමින් සිටි ඇය එම කාර්යය ද අතරමග නවතමින් හිසකේ නොබැඳ ඇවිත් නන්ද කුමරුට "ගියත් සුළඟෙයි, වහා එව" ලෙස පවසන අවස්ථාව ගත් කල එමඟින් පැහැදිලි වන්නේ සද්ධර්මරත්නාවලි කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇති බවයි.
- බුදුන්වහන්සේ නන්ද කුමරුට දුන් පාත්‍රය නොගෙන වෙහෙර දක්වා ගොස් "නන්ද කුමරුනි, මහණවවුදැ'යි" වදාළ අවස්ථාවේ නන්ද කුමරු මහණවීමට අකමැති බව නොකියා කැමැත්ත පළ

PAST PAPERS WIKI

කරන අවස්ථාව ගත් කල එමඟින් පැහැදිලි වන්නේ සද්ධර්මරත්නාවලි කතුවරයා නාට්‍යාකාරයෙන් සිද්ධි නිරූපණය කර ඇති බවයි.

ආදි ලෙස ඕනෑම ගැළපන සිදුවීමක් ලියා නිදසුනක් කොටසක් දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(විස්තරය පමණක් නම් ලකුණු 03කි. නිදසුන පමණක් උපුටා ඇත්නම් ලකුණු 03කි.)

(ලකුණු 6)

නැතහොත්

(i) මිනිස් ක්‍රියාකාරකම් ඇත් පරපුරේ පැවැත්මට තර්ජනයක් වී ඇති ආකාරය පෙන්වමින් ඇත් කුලයට නිදහස ලැබිය යුතු බව මෙම පද්‍ය නිර්මාණයේදී කවියාගේ අපේක්ෂාව විය. එසේම අලි ඇතුන්ගේ උත්තම ගුණාංග හා වටිනාකම් පිළිබඳ අවධාරණය කිරීමත් කවියාගේ අපේක්ෂාව විය.

(ලකුණු 4)

(ii)

- "අම්මල කන කොට
  වතුර නාන කොට
  තිප්පලෙ නිදියන
  කොට වැටිලා
  කැලේ මාමලා
  ඉඩ දී අයිනට
  වෙලා ඉන්නවා
  නොවැ රැකලා"

- "බෝසත් මුත්තල
  ඉස්සර හිටියලු
  අපේ කුලෙත් හොඳ
  නම දුන්නේ"

- "දළ දන් දුන්නලු
  බුදු බව ලැබුවලු
  ඒ ගැනවත් නැහැ
  සලකන්නේ"

- "මිනිසුන් අතරේ
  සමගිය නැති වී
  බුදු හාමුදුරුවො
  එදා අනේ"

- "පාරෙලෙයිය වන
  යට වැඩි දා අපෙ
  මුත්ත කෙනෙකි
  උපකාර වුණේ"

ඉහත උදාහරණ හතරෙන් දෙකක් උපුටා දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණ (04) හිමි වේ. එක උපුටනයක් නම් ලකුණු 02කි.

(ලකුණු 4)

(iii) දෙපා සතාට හෙවත් මිනිසාට ආසන්නයේ ගැවසීම පවා විපත් ගෙන දෙන බව ධ්වනිත කර ඇත. මිනිසාගේ අසත්පුරුෂ ස්වභාවයේ ප්‍රබලතාව මින් ගම්‍ය කෙරේ

(ලකුණු 6)

(iv)

- 'ඇත් ගාලේ දරු පෙම' පද්‍ය පන්තිය තුළින් ඇත් කුලයට මිනිසුන්ගෙන් වන අසාධාරණය මතු කර ඇත. එහිදී අලි ඇතුන්ගේ ගතිගුණ මිනිසා ළඟ කා බී සිටින විට වෙනස් වන බව පවසමින් මිනිස් චර්යා සියුම්ව විවේචනය කරයි.

  "දෙපා සතාගේ
  ළඟ කා බී ගෙන
  සිටියම ගතිගුණ
  වෙනස් වෙලා"

- මිනිසුන්ගේ දුර්ගුණ අනුකරණය කරන ඇතුන් තමන්ගේ ඇත් කුලයට හිරිහැර කරන ආකාරය මගින් කවියා මතුකරන්නේ මිනිසුන්ගේ හදවත තුළ සානුකම්පිත හැඟීම්, මානව දයාව වැනි ගුණ නොමැති බවයි. මෙමඟින් මිනිස් චර්යාවන් සියුම් ව විවේචනය කරයි.

"ළෙහි පපුකම් නෑ
හරි ගතිගුණ නෑ
ඒ බව කවුරුත්
දන්නවනේ"

- ඇත් පරපුරේ බෝසත් ඇතුන් සිටි බවත් පවසමින් කවියා මිනිසුන් තුළ ඇති ආත්මාර්ථකාමී ගති ලක්ෂණ සියුම්ව විවේචනය කරයි.

ඉහත එක් කරුණක් උදාහරණයක් සමඟ මතු කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(ලකුණු 6)

II පත්‍රය - උත්තර පත්‍රය

(01)

(අ) මෙම පද්‍ය පන්තියට පාදක වූ අත්දැකීම

* ජාති, ආගම්, බෙදයකින් තොර ව එකම ශ්‍රී ලාංකේය ජනතාවක් ලෙස ජීවත්වීම හා සමගිය සහජීවනය සහිත රටක් ගොඩ නැගීමේ අවශ්‍යතාව
* උතුර, දකුණ අතර ජාතික සමගියේ අවශ්‍යතාව මතු කිරීම
* සිංහල හා දෙමළ ජනතාව අතර ජාතික සමගියේ අවශ්‍යතාව මතු කරමින් උතුරෙත් දකුණෙත් සමගිය ගොඩනැගීම.

(ඉහත ආකාරයේ අදහසක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)

(ලකුණු 06යි)

(ආ) සිවුපද ආකෘතිය යොදාගෙන ඇත. පේළි හතරකින් යුතු සැම කවියක ම අවසානයේ එළිසමය තබා ඇත.

(සුදුසු එක් උදාහරණයක් සහිත ව විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 06යි)

(ඇ) පද්‍ය පන්තියේ භාෂා භාවිතය

- සරල බස් වහර

"දහදිය හෙළන අප හිරිහැර අතර වැටී"

"දකුණේ මෙන් ම උතුරෙත් හැම තැන ම සිටී"

"මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන විට"

- ව්‍යංග්‍යාර්ථවත් භාෂාව හා සංකේතවත් භාෂාව

"පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්"

"පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ"

"උගතිමි කිම ද මිනිසා සතු දෙනෙත තෙත"

"බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට "

"සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන"

"බේදය පිළිස්සී හමුවේවා දකුණ"

ආදි ගැළපෙන උදාහරණ

- අනුප්‍රාසවත් බස් වහර

"වැටහෙයි නොවැටහුණු සැඟවුණු කරුණු මට"

"රන් තරු රිදී තරු"

ආදි ගැළපෙන උදාහරණ

- රූපක සහිත බස් වහර

"බොල් පිනි බිඳු පබලු ඇට"

- චිත්ත රූප මැවෙන භාෂා භාවිතය

"රන් තරු රිදී තරු හවසට පෙළට ඇදේ"

ආදී ගැළපෙන සුදුසු උදාහරණ

මේ ආකාරයට භාෂා භාවිතයේ විශේෂතා තුනක් දක්වමින් නිදසුන් තුනක් දැක්විය යුතු ය.

උදාහරණ සඳහා	- ලකුණු	03යි
විස්තරයට	- ලකුණු	03යි
මුළු	- ලකුණු	06

(ඈ) උතුරේ හා දකුණේ ජනයා අතරත්, පරිසරය අතරත් සමානකම්

"ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන්ම උතුරෙත් හැම තැනම සිටී"

"දකුණේ මෙන් ම උතුරෙත් හිරු නගියි උදේ
රන්තරු රිදී තරු සවසට පෙළට ඇදේ"

"විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළු ගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී"

"හඳ ඇති දාට රස බර රැස් දහර හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ"

(මෙවැනි සුදුසු උදාහරණ තුනක් සහිතව උත්තර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)

උදාහරණ සඳහා	- ලකුණු	03යි
විස්තරයට	- ලකුණු	03යි
මුළු	- ලකුණු	06

(ඉ) මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු

- යොදාගත් ආකෘතිය
- භාෂාව මැනවින් භාවිත කිරීම
- උතුර, දකුණ අතර පරිසරයේ සමානතා මතු කිරීම.
- කාලීන වටිනාකමකින් යුක්ත අද්දැකීමක් තෝරා ගැනීම.

ආදි කරුණුවලින් තුනක් නිදසුන් සහිතව තහවුරු කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

උදාහරණ සඳහා	- ලකුණු	03යි
විස්තරයට	- ලකුණු	03යි
මුළු	- ලකුණු	06

(රසාස්වාදය මෙම ප්‍රශ්නයට මුළු ලකුණු - 6×5 = 30)

(02)

'තුංමං හන්දිය' නවකතාවේ සාර්ථකත්වයට එහි යොදාගත් බස් වහර ප්‍රබල ලෙස හේතු වී තිබේ. ලේඛකයා උත්තම පුරුෂ දෘෂ්ටිකෝණයෙන් කතාව ඉදිරිපත් කර ඇති අතර, මෙහි ප්‍රධාන චරිතය වන සිරිසේනගේ දෘෂ්ටිය සහ භාෂා රටාව හරහා කතාවේ සාහිත්‍යමය අගය මනාව ඉස්මතු වේ.

නවකතාව තුළ භාවිත වන භාෂා ලක්ෂණ කිහිපයක් පහත පරිදි හඳුනාගත හැකි ය.

- **සරල බස (කෙටි හා පැහැදිලි වාක්‍ය රීතිය):**
  - ළමා මනසට ගෝචර වන අයුරින් පරිසරය හා ස්වභාවය විස්තර කිරීම සඳහා සරල, නිරවුල් වාක්‍ය ඛණ්ඩ යොදාගෙන තිබීම.
  - කුඩා දරුවෙකුගේ අත්දැකීම් හා සිතුවිලි සරල වදන් පෙළකින් සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම.
- **ගැමි බස (ප්‍රාදේශික ව්‍යවහාරය):**
  - ගැමි පරිසරයට හා චරිතවලට උචිත සාම්ප්‍රදායික ව්‍යවහාර (උදාහරණ ලෙස මනමාලයන්, මංගල චාරිත්‍ර, සුබ නැකැත් සහ ග්‍රාමීය කතාබහට අදාළ යෙදුම් භාවිතය).
  - ගැමියන්ගේ කටවහරේ එන ස්වාභාවික ස්වරූපය ඒ අයුරින්ම දෙබස් තුළට එක් කර තිබීම.
- **කාව්‍යමය හා චිත්තරූපී භාෂාව (ප්‍රබන්ධමය ලේඛන ශෛලිය):**
  - අකුරු කියවීමේ හා අධ්‍යාපනයේ මුල් අත්දැකීම් පිළිබඳ මතකයන් සිහිපත් කරමින්, මවගේ ආදරණීය මහපෙන්වීම සහ දරුවාගේ සිතුවිලි සංවේදී ලෙස විස්තර කිරීම.
  - චරිතවල බාහිර හැසිරීම්, ඔවුන්ගේ ඇවතුම් පැවතුම් මෙන්ම පරිසරයේ සජීවී චිත්‍රයක් පාඨකයා ඉදිරියේ මවාපාන උපමා හා විස්තරාත්මක යෙදුම්.
- **භාවපූර්ණ භාෂාව (ස්වභාවධර්මය හා ජීවිතය ගැඹුරින් දැකීම):**
  - නිහඬ පරිසරය, පාවී වැටෙන පිහාටු, දිය පහරවල් සහ ඒ අවට ජීවීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ගැඹුරු නිරීක්ෂණයකින් යුතුව කරන විස්තර.
  - බාහිර පරිසරයේ සිදුවීම් හරහා ජීවිතයේ අනිත්‍ය බව හෝ අභ්‍යන්තර හැඟීම් පිළිබිඹු කරන සංකේතාත්මක හා දාර්ශනික නැඹුරුවක් සහිත භාෂා භාවිතය

  - ප්‍රශ්නයට අදාළ සුදුසු උදාහරණ 3ක් ඉදිරිපත් කිරීම (ලකුණු 02 × 3) = **ලකුණු 06**
  - එම උදාහරණ මැනවින් විග්‍රහ කර තිබීම (ලකුණු 02 × 3) = **ලකුණු 06**
  - භාෂා නිරවද්‍යතාව සඳහා: = **ලකුණු 02**
  - ප්‍රමාණවත් හා පරිපූර්ණ පිළිතුරක් සැපයීම සඳහා: = **ලකුණු 01**
  - **මුළු ලකුණු එකතුව:** (06 + 06 + 02 + 01) = **ලකුණු 15**

(03)

පාඨක/ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කිරීමට සමත් කුස ජාතකය අපූර්වතම කතා වස්තුවකි.

- ඔක්කාක රජුට දරුවන් නොමැති වීම නිසා පුරවාසීන් කියන ලද පිළියමට අනුව රජුගේ මාලිගාවේ තුන් වැදෑරුම් නාටක ස්ත්‍රීන් මුදාහැර නිදහසේ ඇවිද ගොස් දරුවෙකු සාදාගෙන ඒමට අවස්ථාව ලබා දීම.

  "එකල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එලෙස කරවාත් දරු කෙනකුන් නොලදින් නොසතුටු වූහ"

  - සීලවති බිසව මුදා හරින අවස්ථාවේ එතැනට ගිය බමුණු වෙසක් මවා ගත් ශක්‍ර දේවේන්ද්‍රයාට එතැන රැස් වූ බොහෝ දෙනා බැණ වැද අපහාස කරද්දී හැමදෙනාට පෙරටුව බිසවුන් අත අල්ලා ගත් අවස්ථාව

  "කුමක් නිසා මට නින්දා කරවු ද? ශරීරය ජරාපප්‍රාප්ත පමණක් විනා රාගය තරුණ වන්නේය"

- ප්‍රභාවතීන් අගමෙහෙසුන් කරගත් පසු කුස රජුට දහවල් ඇය දැකීමට අවශ්‍ය වූ බැවින් මව්බිසව ඒ අවස්ථාව උදාකර දුන් මොහොතේ ඇත් ගොව්වකු ලෙස සිට කුස රජතුමා ප්‍රභාවතීගේ පිටට ඇත් ඉලත්තියකින් ගැසූ අවස්ථාව හා ඉන්පසු ප්‍රභාවතී කියූ වදන් මගින් හාස්‍ය රසය ජනනය වේ.

  "රජ්ජුරුවන් වහන්සේට කියා නොපගේ අත කප්පාලමි"

මෙහිදී කුස රජතුමාගේ අත් කැපීමට යැයි පවසනවා කියනුයේ කුස රතුමාට ම ය. එම නිසා හාස්‍ය රසය මනාව මතුවේ.

මේ ආකාරයේ ගැළපෙන ඕනෑම උදාහරණ තුනක් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් ප්‍රශ්නය සමග ගළපා ඇතිනම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

උදාහරණ ඒ අයුරින්ම උපුටාගෙන නොමැති වුවද ශිෂ්‍යයන්ගේ වචනයෙන් ලියා තිබුණද සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

සමස්ත ලකුණු බෙදී යන ආකාරය :

- ප්‍රශ්නයට අදාළ සුදුසු උදාහරණ 3ක් ඉදිරිපත් කිරීම (ලකුණු 02 × 3) = **ලකුණු 06**
- එම උදාහරණ මැනවින් විග්‍රහ කර තිබීම (ලකුණු 02 × 3) = **ලකුණු 06**
- භාෂා නිරවද්‍යතාව සඳහා: = **ලකුණු 02**
- ප්‍රමාණවත් හා පරිපූර්ණ පිළිතුරක් සැපයීම සඳහා: = **ලකුණු 01**
- **මුළු ලකුණු එකතුව:** (06 + 06 + 02 + 01) = **ලකුණු 15**

(04)

සමකාලීන සමාජය මනාව නිරූපණය කරන කෙටිකතාවක් ලෙස 'වැලපීම' කෙටිකතාව අගය කළ හැකි ය.

ගැඹුරු මානුෂීය තේමාවක් පාදක කරගත් වැලපීම කෙටිකතාවට වස්තු විෂය වී ඇත්තේ තත්කාලීන රුසියාවේ ජීවත් වූ ඉයෝනා පොටපොෆ් නොමැති අසරණ අශ්ව කරත්තකාරයෙක් ශෝක වේදනා දරා ගනිමින් ජීවිතයට මුහුණ දෙන්නට ගන්නා උත්සාහයයි.

Past Papers Wiki

- ඉයෝනා වැනි අසරණ පුද්ගලයන්ට සමාජයේ විවිධ පුද්ගලයන් සමච්චල් කරන ආකාරය

  "නාකි රාළ උඹේ තොප්පියේ හැටි. මුළු පීටර්ස්බර්ග් නුවරම නෑ. ඔච්චර කබල් තොප්පියක් හොයාගන්න"

  "ඒයි! වධකයා, උඹට ඇහුණද? උඹේ බෙල්ල කඩනවා."

- අනෙකාගේ දුක් ගැනවිලිවලට සවන් දීමට අකමැති, අසරණ මිනිසුන් වෙනුවෙන් කාරුණික වීමට හදවත් නොමැති මිනිසුන් කරන ලද ක්‍රියා

  "කොහේද යකෝ යන්නේ? ද-කු-ණ-ට උඹ දක්කන්න දන්නේ නෑ"

  "පාර හරහා ගමන් කළ මගියෙක් තමාගේ උරහිස අශ්වයාගේ නාසයෙහි හැපුණෙන් අශ්වයා වෙත වියරු බැල්මක් හෙළා"

- පන්ති භේදය මත මිනිසුන්ට විවිධ ආකාරයේ සැලකීම් මතු කර ඇත

  "උඹ මැරිලද බොල නාකියෝ පාර බලාගෙන පලයන්"

- අසරණ පුද්ගලයන්ගෙන් ලබා ගන්නා සේවයට ප්‍රමාණවත් මුදලක් නොගෙවන මිනිසුන් විනෝදය සඳහා විශාල මුදලක් වැය කරන ආකාරය

  "වස්කාත් මාත් බ්‍රැන්ඩි බෝතල් හතරක් ම හිස් කළා"

  "අපි තුන්දෙනාට ම ශ්‍රීවෙනික් දෙකක් දෙන්න"

මේ අයුරින් සුදුසු උදාහරණ තුනක් සහිතව සමකාලීන සමාජය නිරූපණය වන ආකාරය විස්තර කිරීම ප්‍රමාණවත් ය.

සමස්ත ලකුණු බෙදී යන ආකාරය :

- ප්‍රශ්නයට අදාළ සුදුසු උදාහරණ 3ක් ඉදිරිපත් කිරීම (ලකුණු 02 × 3) = ලකුණු **06**
- එම උදාහරණ මැනවින් විග්‍රහ කර තිබීම (ලකුණු 02 × 3) = ලකුණු **06**
- භාෂා නිරවද්‍යතාව සඳහා: = ලකුණු **02**
- ප්‍රමාණවත් හා පරිපූර්ණ පිළිතුරක් සැපයීම සඳහා: = ලකුණු **01**
- **මුළු ලකුණු එකතුව:** (06 + 06 + 02 + 01) = ලකුණු **15**

(05)

සමාජයට උපදෙස් ලබා දීමේ දී අලගිය වන්න මුකවෙටි තුමා සත්ත්ව චරිත හා ක්‍රියාකාරකම් යොදාගෙන ඇත.

- දුර්ජන මිනිසාගේ සකල ශරීරයෙහිම විෂ පවතින බව සත්ත්ව චරිතය ඇසුරින් පෙන්වයි.

කුරිරු ගොර සපුන්ගේ දළගෙහි විසය

මදුරු මැසි කැලන්ගේ තුඩගෙහි විසය

රුදුරු නුහුසුවන්ගේ වලගෙහි විසය

නපුරු දුදනන්ගේ සියොලඟෙහි ම විසය

- සත්පුරුෂයන්ට උපකාර කළ හැක්කේ සත්පුරුෂයන්ට ම බව සත්ත්ව චරිත ඇසුරින් පෙන්වයි.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

විපුල ගුණැති මහතුන් හටපත් විපත

නිසල නැණින් යුතු උතුමෝ ම දුර ලත

කලල ගිලිණු මත වරණිඳු ගොඩ ගනුත

තුමුල බලැති ගිජිඳෙකු මිස අන් කෙවත

- දුර්බල මිනිසුන් ප්‍රභූවරුන් ඇසුරෙන් මානයට පත්වීම සත්ත්ව චරිත ඇසුරින් පෙන්වයි.

පරසිදු පබු දනන් සෙවි පමණින් මහරු

බෙලෙනුදු මඳ වුවත් නොකෙරෙති රුපුන් සරු

බරණිඳු ගෙල වසන නා රද වෙමින් ගරු

ගුරුළිදු අතින් ඇසි කිම යහළු තොරතුරු

මෙවැනි සුදුසු කවි තුනක් ඇසුරින් ප්‍රශ්නයට ගැළපෙන ලෙස සවිස්තරාත්මක පිළිතුරක් ලබා දී ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

සමස්ත ලකුණු බෙදී යන ආකාරය :

- ප්‍රශ්නයට අදාළ සුදුසු උදාහරණ 3ක් ඉදිරිපත් කිරීම (ලකුණු 02 × 3) = ලකුණු **06**
- එම උදාහරණ මැනවින් විග්‍රහ කර තිබීම (ලකුණු 02 × 3) = ලකුණු **06**
- භාෂා නිරවද්‍යතාව සඳහා: = ලකුණු **02**
- ප්‍රමාණවත් හා පරිපූර්ණ පිළිතුරක් සැපයීම සඳහා: = ලකුණු **01**

මුළු ලකුණු එකතුව: (06 + 06 + 02 + 01) = ලකුණු **15**

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank